# මධ්‍යම පරිසර අධිකාරිය

### පරිසර අමාත්‍යාංශය

## තනතුරු පුරප්පාඩු

මධ්‍යම පරිසර අධිකාරියේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

***01. <u>මෝටර් කාර්මික (තනතුරු සංඛ්‍යාව - 01) – PL - 3</u>***

<u>බඳවා ගැනීමේ සුදුසුකම්</u>

බාහිර

**1.** තෘතීයක සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් හතර වන මට්ටමට **(NVQ Level 4)** නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හා

පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක **(02)** පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර

**1.** ඉහත සඳහන් බාහිර අපේක්ෂකයින් විසින් සපුරාලිය යුතු සුදුසුකම් සපුරා තිබීම.

හෝ

**2.** ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු **(PL2)/** නුපුහුණු **(PL1)** තනතුරක වසර **05**ක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම හා ආයතනය මඟින් පවත්වන විෂය ක්ෂේත්‍රයට අදාල පරීක්ෂණයේදී දෙවන මට්ටමේ වෘත්තීය සුදුසුකමට **(NVQ Level 2)** සමාන දක්ෂතාවයක් දැක්වීම.

වැටුප් පරිමාණය **- 43,280 – 10x490 – 10x540 – 10x590 -12x630 – 67,040**
වැටුප් ගෙවනු ලබන්නේ කළමණාකරන සේවා චක්‍ර ලේඛ අංක **01/2025** හි උප ලේඛණ **ll** ට අනුව වේ.

***02. <u>නඩත්තු කාර්මික (තනතුරු සංඛ්‍යාව - 01) – PL - 3</u>***

<u>බඳවා ගැනීමේ සුදුසුකම්</u>

බාහිර

**1.** තෘතීයක සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් හතර වන මට්ටමට **(NVQ Level 4)** නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

අභ්‍යන්තර

**1.** ඉහත සඳහන් බාහිර අපේක්ෂකයින් විසින් සපුරාලිය යුතු සුදුසුකම් සපුරා තිබීම.

හෝ

**2.** ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු **(PL2)/** නුපුහුණු **(PL1)** තනතුරක වසර **05**ක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම හා ආයතනය මඟින් පවත්වන විෂය ක්ෂේත්‍රයට අදාල පරීක්ෂණයේදී දෙවන මට්ටමේ වෘත්තීය සුදුසුකමට **(NVQ Level 2)** සමාන දක්ෂතාවයක් දැක්වීම.

වැටුප් පරිමාණය - 43,280 – 10x490 – 10x540 – 10x590 -12x630 – 67,040

වැටුප් ගෙවනු ලබන්නේ කළමණාකරන සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උප ලේඛණ ll ට අනුව වේ.

### *03. <u>පොම්ප ක්‍රියාකරු (තනතුරු සංඛ්‍යාව - 01) – PL - 2</u>*

<u>බඳවා ගැනීමේ සුදුසුකම්</u>

බාහිර

1. තෘතියක සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව නිකුත් කරන ලද දෙවන මට්ටමේ වෘත්තීය සුදුසුකමට (NVQ Level 2) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

අභ්‍යන්තර

1. ඉහත සඳහන් බාහිර අපේක්ෂකයින් විසින් සපුරාලිය යුතු සුදුසුකම් සපුරා තිබීම.

හෝ

2. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (PL1) තනතුරක වසර 05ක සතුටුදායක සේවයක් සිදුකර තිබීම හා ආයතනය මඟින් පවත්වන විෂය ක්ෂේත්‍රයට අදාල පරීක්ෂණයේදී දෙවන මට්ටමේ වෘත්තීය සුදුසුකමට (NVQ Level 2) සමාන දක්ෂතාවයක් දැක්වීම .

වැටුප් පරිමාණය - 42,300 – 10x490 – 10x540 – 10x590 -12x630 – 66,060

වැටුප් ගෙවනු ලබන්නේ කළමණාකරන සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උප ලේඛණ ll ට අනුව වේ.

මෙම තනතුරු ස්ථිර තනතුරු වන අතර, සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට හිමිකම් ලබයි.

සියළුම අයදුම්කරුවන්,

- වයස අවුරුදු 18ට නොඅඩු වියයුතු අතර අවුරුදු 45 කට නොවැඩි විය යුතුය.
- තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
- විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය.

<u>අමතර ප්‍රතිලාභ</u>

01. ඉතිරි වෛද්‍ය නිවාඩු ප්‍රතිපූර්ණය කිරීම
02. වෛද්‍ය රක්ෂාණවරණ පහසුකම
03. ආපදා ණය පහසුකම

<u>බඳවා ගැනීමේ ක්‍රමවේදය</u>

මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවත්වනු ලබන පරීක්ෂණයක් මගින් හා/හෝ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබගත් අය තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ලැබේ. අදාළ පරීක්ෂණය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද ක්‍රමවේදයට අනුව සිදු කරනු ලැබේ.

<u>අයදුම්පත්‍ර යොමුකිරීම</u>

ඔබගේ අයදුම්පත උප්පැන්න සහතිකය, අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහතික සහ සේවා සහතික වල පිටපත් සමඟ ඥාතී නොවන නිර්දේශිතයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් දුරකථන අංක සහිතව ලියාපදිංචි තැපෑලෙන් **2025.11.10** දිනට ප්‍රථම පහත දක්වා ඇති ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු අතර අභ්‍යන්තර අයදුම්කරුවන් තම ප්‍රධානියා මගින් ඉහත පරිදි අයදුම්පත යොමුකළ යුතුය.

අයදුම්පත් බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද අයදුම්පත් පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරිය වගකියනු නොලැබේ.

අයදුම්පත්‍ර භාරගන්නා දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අවශ්‍ය අවස්ථාවකදී, මෙම දැන්වීමේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්
මධ්‍යම පරිසර අධිකාරිය
**104,** ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල
**2025.10.26**